5/7/1/3



යොමු අංකය : ව/පස/2/1/19.

## වයඹ පළාත් සභාව

### වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 04 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 1992.11.17 වැනි දින සම්මත කරන ලදුව, 1993.09.16 වැනි දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළුදෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

සම්පත් එම්. දසනායක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

1993 ඔක්තෝබර් මස 13 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

### වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 04 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය

*පළාත් ක්‍රීඩා මණ්ඩලය, දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල, ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම සඳහා ද, ක්‍රීඩා අරමුදලක් ඇති කිරීම සඳහා ද, ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ද, ක්‍රීඩා සිංහාසන සහ ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම සහා ද, ක්‍රීඩා සංකීර්ණ පිහිටුවීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසක් වූ ප්‍රඥප්තියකි*

මෙම ප්‍රඥප්තිය 1973 අංක 25 දරන ක්‍රීඩා පනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 04 දරන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. මේ ප්‍රඥප්තියෙහි දක්වා ඇති කාර්යයන් සඳහා මේ ප්‍රඥප්තියෙහි මතු දක්වෙන විධිවිධාන වලට අනුකූලව – පළාත් ක්‍රීඩා මණ්ඩල ආදිය පිහිටුවීම.

(අ) පළාත් ක්‍රීඩා මණ්ඩලයක් ;

(ආ) දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල ;

(ඇ) ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල ;

(ඈ) වයඹ ක්‍රීඩා අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ; සහ

(ඉ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ක්‍රීඩා ශිල්පායතන හා ක්‍රීඩා සංකීර්ණ සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය හැකිය.

3. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලබන වගකීම් සහ කාර්යයන් යථා පරිදි ඉටු කිරීම සඳහා පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙක් අමාත්‍යවරයා විසින් පත් කළයුතු වන්නේ ය. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් පත් කිරීම.

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කලින් කලට අවශ්‍ය විය හැකි සහකාර අධ්‍යක්ෂවරුන් සහ වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය හැකි ය.

(3) මෙම වගන්තියේ (1) සහ (2) වන උප වගන්ති යටතේ පත් කරනු ලබන සියළුම නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ පත් කරන ලද සියළු නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ තම වගකීම් සහ කාර්යයන් ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ හෝ විධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

I වැනි කොටස

වයඹ ක්‍රීඩා මණ්ඩල, දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල හා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම

*වයඹ පළාත් ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම.*

4. (1) වයඹ පළාතේ ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය දියුණු කිරීම, සංවර්ධනය කිරීම සහ උනන්දු කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා මෙහි මින්මතු "මණ්ඩල" යනුවෙන් සඳහන් කරනු ලබන "වයඹ පළාත් ක්‍රීඩා මණ්ඩලය" පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඒ මණ්ඩලය –

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන් සහ වෙනත් සාමාජිකයින් හතර දෙනෙකු ;
(ආ) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ;
(ඇ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ;
(ඈ) පළාත් තරුණ සේවා අධ්‍යක්ෂ ;
(ඉ) පළාත් පාලන පළාත් කොමසාරිස් ;
(ඊ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

යන අයගෙන් සමන්විත විය යුතු ය.

(3) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා එම මණ්ඩලයේ ලේකම් ධුරය දැරිය යුතු ය.

*වයඹ පළාත් ක්‍රීඩා මණ්ඩලයේ වගකීම්, කාර්යභාරය හා රිසි.*

5 (1) මණ්ඩලයේ වගකීම්, කාර්යභාරය සහ මණ්ඩල රැස්වීම්වල ගණපූරණය මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා මණ්ඩලය විසින් රිසි සැදිය හැකි ය.

*දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම.*

6. (1) වයඹ පළාතට අයත් දිස්ත්‍රික්කවල ක්‍රීඩා සහ ශාරීරික අභ්‍යාස අධ්‍යාපනය නගා සිටුවීම, සංවර්ධනය කිරීමට උනන්දු කරවීමට හා පාලනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා "දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයක්" රජයේ ගැසට් පත්‍රයෙන් පළකරනු ලබන නියමයක් අනුව පිහිටුවනු ලැබිය හැකිය.

(2) දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපති සහ සාමාජිකයින් දෙදෙනෙකු ;
(ආ) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අභ්‍යාස)
(ඇ) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී ;
(ඈ) දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරී ;
(ඉ) 19 වැනි වගන්තියට අනුව ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගමයන්හි නියෝජිතයෙකු බැගින්.

(3) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී මණ්ඩලයේ ලේකම් විය යුතු ය.

*දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලවල වගකීම්, කාර්ය භාරය හා රිසි.*

7.(1) දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයක වගකීම්,කාර්ය භාරය හා මණ්ඩල රැස්වීම්වල ගණපූරණය මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) සෑම දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයක් විසින් ම ඒ මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පටිපාටිය හා ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා රිසි සැදිය හැකිය.

*ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම.*

8. (1) වයඹ පළාතේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රීඩා සහ ශාරීරික අභ්‍යාස අධ්‍යාපනය නගා සිටුවීමට, සංවර්ධනය කිරීමට, උනන්දු කරවීමට සහ පාලනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයට උපදෙස් හා නිර්දේශ දීම පිණිස අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා "ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයක්" පිහිටුවනු ලැබිය හැකිය.

(2) ඒ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය ;

(අ) අදාළ ප්‍රාදේශීය ලේකම් ;
(ආ) අදාළ කොට්ඨාශයේ ක්‍රීඩා නිලධාරී ;
(ඇ) නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක් ;
(ඈ) තරුණ සේවා නිලධාරී ;

(ඉ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් හතර දෙනෙකු ;
(ඊ) මෙම ප්‍රඥප්තියෙහි මින්මතු එන විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කරන ලද එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමාවට අයත් ක්‍රීඩා කරන්නන්ගේ සමාජවල නියෝජිතයන් දෙදෙනෙකු.

(3) ප්‍රාදේශීය ලේකම් මෙම මණ්ඩලයේ සභාපති විය යුතු ය.

(4) ක්‍රීඩා නිලධාරී, මණ්ඩලයේ ලේකම් විය යුතු ය.

*ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලවල වගකීම් හා කාර්යභාරය*

9. (1) ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයක වගකීම්, කාර්යභාරය සහ මණ්ඩල රැස්වීම්වල ගණපූරණය මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) සෑම ප්‍රාදේශීය මණ්ඩලයක් විසින් ම ඒ මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා රීති සෑදිය හැකිය.

*ඒ ඒ මණ්ඩල සාමාජිකයින්ගේ ධූර කාලය*

10. (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලයකට පත් කරනු ලබන සාමාජිකයින් මිය යෑමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ කලින් ධූරය හිස් වුවහොත් මිස තුන් අවුරුදු කාලසීමාවක් දැරිය යුතුය.

(2) මණ්ඩලයකට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කිරීම අවශ්‍යතාවෙන් බැව් අමාත්‍යවරයා සලකතොත් හේතු නොදක්වා එසේ කළ හැකිය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය හිස්වන යම් සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තකු එසේ හිස්වූ ධූරය දැරූ සාමාජිකයාගේ ධූර කාලයෙන් ගත නොවී ඉතිරිව ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතු ය.

(4) කාලය ඉකුත් වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයකු අසනීපව සිටීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ එම ධූරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් වැඩ බැලීමට වෙනයම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය.

*නුසුදුසුකම්*

11. යම් තැනැත්තකු —

(අ) නීති බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ආ) නීති බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ඇ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයකදී වරදකරු කරනු ලැබුවහොත් ; හෝ

(ඈ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් නිෂ්පාදනය කිරීමෙහි, කොටස් එක් කර සෑදීමෙහි හෝ විකිණීමෙහි ලා කෙලින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් දරතහොත් හෝ ඒ තැනැත්තා යම් ක්‍රීඩා මණ්ඩලයකට පත් කරනු ලැබීමට නුසුදුස්සකු විය යුතු ය.

## II වැනි කොටස

### වයඹ ක්‍රීඩා අරමුදල පිහිටුවීම හා පරිපාලනය

*වයඹ ක්‍රීඩා අරමුදල පිහිටුවීම.*

12. (1) වයඹ පළාතේ ක්‍රීඩා සඳහා උනන්දු කරවීම, දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ හා "වයඹ ක්‍රීඩා අරමුදල" යනුවෙන් හැඳින්වෙන්නාවූ අරමුදලක් පළාත් අරමුදලේ වෙනම ගිණුමක් වශයෙන් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මෙම අරමුදල 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වැනි කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතු ය.

*අරමුදලට කරනු ලබන ගෙවීම්*

13. (අ) රජය මගින් වරින්වර ආධාර වශයෙන් ප්‍රදානය කරනු ලැබිය හැකි සියළුම මුදල් ;

(ආ) අරමුදලේ කාර්යයන් සඳහා කලින් කල වයඹ පළාත් සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියළුම මුදල්;
(ඇ) පළාත් සභා පනතේ 22 වන වගන්තිය යටතේ රජය විසින් ලබාදෙන විදේශීය රටවලින් ආධාර වශයෙන් ලැබෙන සියළුම මුදල් ;

(ඈ) යම් තැනැත්තෙකු විසින් අරමුදලට කරන ලද පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල් ; සහ
(ඉ) වෙනයම් මාර්ගයකින් ලැබෙන මුදල්

අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද යම් නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගතයුතු වීමේ කොන්දේසිය පිට මෙම වගන්තියේ (ආ), (ඈ), (ඉ) ඡේද යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක ඒ මුදල් අරමුදලේ බැරට භාර ගැනීම සම්පූර්ණයෙන්ම අමාත්‍යවරයාගේ අභිමතය අනුව විය යුතුය.

චංචල හා නිශ්චල දේපල පරිත්‍යාග.

14. යම් නිශ්චල හෝ චංචල දේපලක් ප්‍රදාන වශයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව එහි කාර්යයන් සඳහා යෙදීම පිණිස අරමුදල වෙනුවෙන් අමාත්‍යවරයා විසින් භාරගනු ලැබිය හැකි ය. එවැනි යම් දේපලක් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සහ ඔහු විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල් අරමුදලට බැරකරනු ලැබිය හැකිය.

අරමුදලෙහි පරිපාලනය.

15. (1) අරමුදල අමාත්‍යවරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ තිබිය යුතු අතර, එය අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව ලේකම් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) ව්‍යාඹ පළාත් ක්‍රීඩා මණ්ඩලය අරමුදල් පාලනය පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා උපදේශක මණ්ඩලය වශයෙන් කටයුතු කළ හැකි ය.

(3) එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් පරිපූර්ණ ලෙස හා උචිත ලෙස අරමුදලේ ගිණුම් තබාගෙන යාමට ලේකම් විසින් සැලැස්විය යුතු ය.

(4) එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම් විසින් පිළියෙල කළ යුතු ය.

(5) 1971 අංක 38 දරන මුදල් පනතෙහි 11 වැනි කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත අරමුදලේ මුදල් පාලනය සහ ගණන් සිලවී සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

අරමුදල පිළිබඳ වාර්තාව.

16. අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මනින් එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදලේ පරිපාලනය සඳහා වූ වාර්තාවක් එම අරමුදලේ විගණනය කරන ලද එම වර්ෂයේ ගණන්වල පිටපතක් ද, ඒ ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගෙන් වාර්තාව ද සමඟම ව්‍යාඹ පළාත් සභාව හමුවේ තැබිය යුතු ය.

අරමුදලෙන් කරනු ලබන ගෙවීම්.

17. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් –

(අ) ව්‍යාඹ පළාතේ යම් ක්‍රීඩාවකට ධෛර්යය දීම, දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ද ;

(ආ) ක්‍රීඩා විෂයයෙහි උන්නතියට දායක වීමට සැලකිලි වශයෙන් ක්‍රීඩාවලට දැනට සහභාගිවන්නන්ට සහ/හෝ ඉහත දී සහභාගිවූවන්ට කරුණාසහගත ගෙවීම් වශයෙන් ද ;

(ඇ) යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස හෝ ආණ්ඩුවේ ණයකර ලෙස හෝ ආයෝජනය කිරීම සඳහා ද ;

(ඈ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා ද ;

(ඉ) ව්‍යාඹ පළාත නියෝජනය කරන ක්‍රීඩා කණ්ඩායම්වල විදේශ සංචාර හා විදේශ ක්‍රීඩා කණ්ඩායම්වල ව්‍යාඹ පළාත් සංචාර සඳහා අවශ්‍ය ගෙවීම් සඳහා ද ;

(ඊ) ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන වෙනත් කාර්යයන් සඳහා ද අරමුදලෙන් ගෙවිය හැකි ය.

## III වැනි කොටස

### ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය

ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් නම් කිරීම.

18. අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක් මගින් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් හෝ පළාත් ක්‍රීඩාවක් නැතහොත් පළාත් ක්‍රීඩා වර්ගයක් ලෙස නම් කරනු ලැබිය හැකි අතර, ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා වර්ගය හෝ සඳහා පළාත් සංගමයක් මැගින් පිහිටුවිය හැකි ය.

19. 18 වැනි වගන්තිය යටතේ යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් හෝ නම් කරනු ලැබූ කල්හි – *ක්‍රීඩා සංගම්.*

(අ) ඒ නියමය කරනු ලැබූ අවස්ථාවට පෙරාතුව සිට යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් පිළිබඳව යම් පළාත් සංගමයක් පවතී නම්, එවැනි සංගමයක් මෙම ප්‍රඥප්තියෙහි මතුවට එළඹෙන විධිවිධාන යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ආ) ඒ නියමය කරනු ලැබූ අවස්ථාව පසුව යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩාවර්ගයක් හෝ පිළිබඳව යම් පළාත් සංගමයක් පිහිටුවනු ලැබුවහොත්, එසේ පිහිටුවනු ලැබූ දිනයේ සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට මත්තෙන් මෙම ප්‍රඥප්තියේ මතුවට එළඹෙන විධිවිධාන යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතු ය.

20. ලියාපදිංචිය පිළිබඳ යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සමූහයක් හෝ විසින් ඒ තීරණවලට හෝ ක්‍රියාවට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එම අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. *ලියාපදිංචිය පිළිබඳ තීරණවලට හා ක්‍රියාවලට විරුද්ධ අභියාචනා.*

21. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය – *ක්‍රීඩා සංගම් පිළිබඳව අමාත්‍යවරයා සතු බලතල.*

(අ) ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය සහ ඒවා ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු ;

(ආ) සංගම්වල සංයුතිය හා සංස්ථාපනය ;

(ඇ) ඒ සංගම්වල වගකීම්, බලතල සහ කාර්යයන් ;

(ඈ) ඒ සංගම්වල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය ; සහ

(ඉ) ඒ සංගම් විසින් පුහුණුකරුවන්, තීරකයන් හා විනිසුරුවන් පත් කිරීමේ කාර්ය පටිපාටිය.

22. (අ) සංගමයේ නිලධාරීන්ගේ හෝ සාමාජිකයන්ගේ දූෂණ, විෂමාචාර හෝ අකමිකතා සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබූ විට ඒ නිවේදනයේ සඳහන්ව තිබිය හැකි කාලය තුළදී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත්වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසලකා හැරීම නිසා ; හෝ *ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම අත්හිටුවීම සහ අවලංගු කිරීම.*

(ආ) අමාත්‍යංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා අකර්මන්‍යව සිටීම, සහයෝගය නොදීම හෝ අවහිර කිරීම නිසා ; හෝ

(ඇ) සංගමයේ යුතුකම් සහ කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම නිසා ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම, ප්‍රතික්ෂේප කිරීම හෝ එහි ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීමේ නියෝගයක් මගින් අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය. අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

23. අත්හිටුවනු ලැබූ හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ නැතහොත් අවලංගු කරනු ලැබූ ක්‍රීඩා සංගමයක කාර්යයන් කරගෙන යාම සඳහා අමාත්‍යවරයා විසින් අතුරු විධිවිධාන යෙදිය හැකි ය. *අතුරු විධිවිධාන.*

24. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි නොකරන ලද කිසිම ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් මෙම ප්‍රඥප්තිය යටතේ ලැබිය යුතු වූ ආධාර, පහසුකම් හෝ වෙනත් ප්‍රදානයකට සුදුසුකම් නො ලබයි. *පහසුකම් ලැබීමට නුසුදුසුකම්.*

25. 19 වන වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් නොකළ හෝ ලියාපදිංචි කිරීම 22 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද හෝ අත්හිටුවනු ලද හෝ අවලංගු කරන ලද හෝ යම් ක්‍රීඩා සංගමයක නිලධාරීන්ට එම සංගමය සතු නිධිවල, එංවල දේපළ නියමිත කාලයක් තුළ, අතුරු විධිවිධාන මගින් නිශ්චය කරනු ලබන බලධරයන්ට භාරදීමට කටයුතු කළයුතු බවට අමාත්‍යවරයා විසින් නියෝග කළ හැකි ය. *පළාත් ක්‍රීඩා සංගම් ලියා පදිංචිය අත්හිටුවීම.*

26. යම් ක්‍රීඩා සංගමයක් සම්බන්ධයෙන් 25 වන වගන්තිය යටතේ කරන ලද නිමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම අවස්ථාවෝචිත බව අමාත්‍යංශයේ ලේකම්වරයා සලකහොත් ඔහුගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් තමාගේ අභිමතය පරිදි ඒ සංගමය ලියාපදිංචි කිරීමට හෝ නැවත ලියාපදිංචි කිරීමට හෝ අවසර දිය හැකි ය. *ලියා පදිංචිය අවලංගු කිරීමේ නියෝගයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම.*

## *IV වැනි කොටස*

### *ක්‍රීඩා ශිෂ්‍යත්ව පිහිටුවීම*

27. අමාත්‍යවරයා විසින් පහත සඳහන් අරමුණු සඳහා ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදාන එකක් හෝ වැඩි ගණනක් ඇති කළ හැක – *ක්‍රීඩා ශිෂ්‍යත්ව.*

(අ) ක්‍රීඩා ශාරීරික අභ්‍යාස අධ්‍යාපනය හා විනෝදය පිළිබඳ දැනුවත් කිරීම.

(ආ) ක්‍රීඩා පිළිබඳ පසළ හැකියාව ඇති දරු දැරියන්ගේ දෙමව්පියන් තුළ ඇති සාංකාව සහ බිය තුරන් කිරීමට කටයුතු කිරීම.

(ඇ) ක්‍රීඩා පිළිබඳ උපන් හපන්කම් ඇත්තවුන් සොයා, මවුන්ට ඒවා දියුණු කරගැනීමට අවස්ථාව සලසා දීම.

(ඈ) උපරිම ක්‍රියාකාරිත්වය සඳහා විද්‍යානුකූල පුහුණුවීම් නියමිත වයසේ ලබාදීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

නියෝග

28. (අ) ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තෝරා ගැනීම ;

(ආ) ශිෂ්‍යත්ව ප්‍රදානයේ වාර්ෂික වටිනාකම ;

(ඇ) මෙම කරුණු සඳහා සම්බන්ධීකරණ නිලධාරීන්, කථිකාචාර්යවරුන්, පුහුණු කරන්නන්, ආචාර්යවරුන්, උපදේශකයින් සහ වෙනත් නිලධාරීන් පත් කිරීම, ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

යන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නියෝග සම්පාදනය කල හැක.

පහසුකම් සැලසීමට අමාත්‍යවරයාට ඇති බලය.

29. (අ) නේවාසික හෝ වෙනත් ආකාරයේ පුහුණුවීම් සඳහා අවශ්‍ය පහුකම්, උපකරණ, ගොඩනැගිලි සම්පාදනය කිරීමට ;

(ආ) ඉහත (අ) ඡේදයේ පුහුණුවීම් පවතින ශිල්පායතන හෝ ආයතනයන්හි ශිෂ්‍යත්වලාභීන්ගේ විනය හා සුභසාධන කටයුතු ක්‍රමවත් කිරීමට ;

අමාත්‍යවරයාට බලය තිබිය යුතු ය.

ක්‍රීඩා සංකීර්ණ ආදිය පිහිටුවීම.

30. මෙහි මින්මතු "ක්‍රීඩා සංකීර්ණ" ලෙස හඳුන්වනු ලබන, පුහුණු කටයුතු, තරග, ශාරීරික අභ්‍යාස, විනෝද ක්‍රීඩා ආදියට උනන්දු කරවීම, ඒවා ප්‍රගුණ කිරීම හා සංවර්ධනය කිරීම උදෙසා සංකීර්ණ, ක්‍රීඩාංගණ, ක්‍රීඩා පිට්ටනි පිහිටුවීමට හෝ පිහිටුවීමට අනුග්‍රහය ලබාදීමට හෝ අමාත්‍යවරයාට හැකි වන්නේ ය.

අරමුදල් ඇති කිරීම.

31. ඉහත 30 වැනි වගන්තියේ සඳහන් ආයතන පිහිටුවීම හෝ ඉදිකිරීම සඳහා මුදල් ඒ ඒ ආයතන විසින් සපයා ගතයුතු අතර, එවැනි මුදල් සඳහා අරමුදල් පිහිටුවීමට අමාත්‍යවරයා විසින් අවස්ථානුගතව නියෝග මගින් ප්‍රතිපාදන සැලසිය හැකි ය.

ගොඩනැගිලි සැපයීමට අමාත්‍යවරයාට ඇති බලය.

32. එකී ක්‍රීඩා සංකීර්ණයන්හි නේවාසික ගොඩනැගිලි සැපයීම හෝ ඒවා ඉදිකිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම හෝ ඒවාට උපකරණ සැපයීම හෝ කිරීමට අමාත්‍යවරයාට බලය ඇත.

නියෝග

33. (අ) ඉහත කී ක්‍රීඩා සංකීර්ණයන්හි පාලනය කාර්මික හෝ වෙනත් නිලධාරීන් පත් කිරීම, වැටුප් ගෙවීම ;

(ආ) එකී ක්‍රීඩා සංකීර්ණයන්හි පහසුකම් සැපයීම ;

(ඇ) එකී ක්‍රීඩා සංකීර්ණයන්හි සවි කරන උපකරණ හෝ පාවිච්චි කිරීමේදී සැලකෙන ආරක්ෂාව පිළිබඳ තත්ත්වයන්

පිළිබඳව නියෝග පැනවීමට අමාත්‍යවරයාට බලය ඇත.

## V වැනි කොටස

### ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම

ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම.

34. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා මෙහි මින්මතු ශිල්පායතන යනුවෙන් සඳහන් කරනු ලබන හෝ ක්‍රීඩා ශිල්පායතන එකක් හෝ ගණනාවක් පිහිටුවනු ලැබිය හැකි ය :–

(අ) ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ දැනුම, උපදෙස් සහ පුහුණුව ලබාදීම ;

(ආ) එම ශිල්පායතනවල ශිෂ්‍යයින් විසින් ලබා ඇති ප්‍රවීනතාවය නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම ; සහ

(ඇ) එම ශිල්පායතන විසින් පවත්වනු ලබන විභාගවලින් සමත් වූ අයට අභිඥාණ පත්‍ර පිරිනැමීම සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම.

35. අමාත්‍යවරයා විසින් නියෝග මගින් :– *(ක්‍රීඩා ශිල්පායතනවලට ඇතුළත් කිරීමේ පටිපාටි සහ වෙනත් කරුණු.)*

(අ) ශිල්පායතනවලට ඇතුළත් කර ගැනීමේ පටිපාටි ;

(ආ) ඒ ශිල්පායතනවල අධ්‍යාපනය, පුහුණුව සහ විභාග පිළිබඳ පටිපාටි ; සහ

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි ඒ ශිල්පායතනවලට අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, ගුරුවරුන්, උපදේශකයන් සහ වෙනත් නිලධරයන් පත් කිරීම සහ ඔවුනට වැටුප් ගෙවීම පිළිබඳ පරිපාටි

නියම කරනු ලැබිය හැකි ය.

36. අමාත්‍යවරයාට .– *(ක්‍රීඩා ශිල්පායතන පහසුකම් සැලසීම, විනය පාලනය ආදිය සඳහා අමාත්‍යවරයා සතු බලය.)*

(අ) ඒ ශිල්පායතනවලට පහසුකම් සැපයීම සහ පුහුණුව, නේවාසික පහසුකම් හා ඒ ශිල්පායතනවල වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, ඒවා නඩත්තු කිරීම සහ උපකරණ සැපයීම සඳහා ද ;

(ආ) ඒ ශිල්පායතනවල ශිෂ්‍යයින්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ විනය සහ සුභසාධනය ඇති කිරීම සහ විධිමත් කිරීම සඳහා ද ;

(ඇ) ඒ ශිල්පායතන මගින් අභිඥාණ පත්‍ර සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද බලය තිබිය යුතු ය.

## VI වැනි කොටස

## පොදු විධිවිධාන

37. (1) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, සංගම්වල හෝ වෙනත් සංවිධානවල බලතල ක්‍රියාවෙහි යෙදවීම, කාර්යයන් කිරීම සහ වගකීම් ඉටුකිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ ඒ මණ්ඩලය, සංගමය හෝ සංවිධාන වෙත පොදු හෝ විශේෂ හෝ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ මණ්ඩලය, සංගමය හෝ වෙනත් සංවිධානයක් විසින් ඒ විධාන ක්‍රියාවෙහි යෙදවිය යුතු ය. *(අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ විධිවිධාන.)*

(2) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, සංගම්වල සහ වෙනත් සංවිධානවල හා දේපළ කටයුතු සම්බන්ධයෙන් වූ වාර වාර්තා, ගණන් සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍ය විය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඒ මණ්ඩලවලට, සංගම්වලට සහ වෙනත් සංවිධානවලට කලින්කල විධාන කළ හැකි අතර, ඒ මණ්ඩල, සංගම් සහ වෙනත් සංවිධාන ඒ හැම විධානයක්ම අනුව ක්‍රියා කළයුතුව ඇත.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, සංගම්වල සහ වෙනත් සංවිධානවල කටයුතු සියල්ලම හෝ ඉන් යමක් තමන් විසින් නිශ්චයකරනු ලැබිය හැකි තැනැත්තකු විසින් විමර්ශණය කරන ලෙසක්, අමාත්‍යවරයා විසින් කලින්කල නියම කළ හැකි අතර, එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක්ම ක්‍රියාවෙහි යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියළු පහසුකම් සැලැස්වීම සහ සියළු තොරතුරු සැපයීම ඒ මණ්ඩලය, සංගමය සහ වෙනත් සංවිධානයක් විසින් කළ යුතු ය.

38. (1) වයඹ පළාත නියෝජනය වීම සඳහා ශ්‍රී ලංකාවේදී හෝ විදේශයන්හිදී හෝ ක්‍රීඩකයෙකුට හෝ ක්‍රීඩා කණ්ඩායමට සහභාගීවීම සහ පාලනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නියෝග සෑදීමට හැක. *(අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම)*

(2) පළාත් පාලන ආයතන හෝ වෙනත් රාජ්‍ය අනුබද්ධිත ආයතන හෝ සේවා යෝජකයින් විසින් සැපයිය යුතු අවම ක්‍රීඩා හා විනෝද පහසුකම් පිළිබඳ නියෝග පැනවීමට අමාත්‍යවරයාට හැක.

(3) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහාත්, නියම කළයුතු යයි හෝ නියෝග සෑදිය යුතුයයි හෝ බලය දී ඇති වෙනත් සියළු කරුණු සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම රජයේ ගැසට් පත්‍රයේ පළ කළයුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තිබිය හැකි පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා වයඹ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනුමත නොකළ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුදු, ඒ යටතේ කලින් කරන ලද යම් ක්‍රියාවකට ඉන් හානියක් නොවිය යුතු ය.

අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබිය යුතු ය.

පාරිශ්‍රමික.

39. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් ක්‍රීඩා මණ්ඩලයේ සාමාජිකයන්ට සහ දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලවල සාමාජිකයන්ට වයඹ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ ප්‍රමාණයට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

40. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි – "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ ක්‍රීඩා විෂය පවරනු ලැබූ අමාත්‍යවරයා ද ;

"අමාත්‍යාංශය" යන්නෙන් ඉහත කී අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය ද ;

"ලේකම්" යන්නෙන් ඉහත කී අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ද ;

"ක්‍රීඩා" හෝ "ක්‍රීඩාව" යන්නට මෙම ප්‍රඥප්තියේ කාර්යයන් උදෙසා අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ යම් ආකාරයක ක්‍රීඩා, විනෝද ක්‍රීඩා, ශාරීරික අභ්‍යාස කාය වර්ධන ව්‍යායාම සහ වෙනත් ව්‍යායාම ද අදහස් කෙරේ.

අනනුකූල භාවය.

41. මෙම ප්‍රඥප්තියෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් වේ නම් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

11–99/1